# පටුන


පිටුව

1.0 විෂය නිර්දේශය

1.1 හැඳින්වීම 2

1.2 චිත්‍රකලාව විෂයයේ අරමුණු 3

1.3 විෂයයට අදාළ නිපුණතා 3

1.4 ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් 4

1.5 නිපුණතා, නිපුණතා මට්ටම්,
විෂය අන්තර්ගතය හා කාලච්ඡේද 5-7

1.6 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපා 8-9

1.7 ඉගෙනුම් ප්‍රවර්ධනය සඳහා පාසල් ප්‍රතිපත්ති හා
වැඩසටහන් 10

**2.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය**

2.1 හැඳින්වීම 12-14

2.2 ගුරු භවතුන්ට උපදෙස් 15

2.3 ක්‍රියාකාරකම් වාරවලට බෙදීම 16

2.4 ක්‍රියාකාරකම් සන්තතිය 17-123

**3.0 තක්සේරුව හා ඇගයීම**

3.1 හැඳින්වීම 126-127

3.2 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
දීර්ඝ කිරීමේ උපකරණ 128-131

# 1.0 විෂය නිර්දේශය

## 1.1 හැඳින්වීම

සුසමාහිත පෞරුෂ වර්ධනයක් ගොඩනැගීමෙහිලා උපකාරී වන සෞන්දර්ය ක්ෂේත්‍ර අතරින් චිත්‍ර කලා විෂයයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

චිත්‍ර කලාව නව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සැලසුම් කිරීමේදී, පාසල් සිසු දරුවාගේ දැනුම, අකාල්ප, කුසලතා වර්ධනය කරලීම සඳහා ප්‍රධාන නිපුණතා හතක් පාදක කර ගැනේ. වින්දන ශක්ති වර්ධනය, නිර්මාණ කුසලතා පෝෂණය, විචාර බුද්ධි වර්ධනය මෙන් ම, ඉවසීම, සංයමය, චිත්තවේග පාලනය, සහයෝගීතාව වැනි ආධ්‍යාත්මික ගුණවගා වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් විෂය අන්තර්ගතය සැලසුම් කොට ඇත.

චිත්‍ර කලා රසාස්වාදය, සංස්කෘතික පසුබිම, සිද්ධාන්ත, ප්‍රායෝගි කරණය හා නිර්මාණ කුසලතා වර්ධනය ආශ්‍රිත විෂය පරාසයකින් සමන්විත සෞන්දර්ය ක්‍රියාකාරකම් සමූහයකින් ආවරණය වී ඇති මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යයනයෙන් ස්වභාවික ව හා නිර්මිත ව උදාවිය හැකි අනාගත අභියෝග සඳහා මුහුණදීමට සමත් වූ නූතන වැඩ ලෝකයේ ජීවන කුසලතා සඳහා යෝග්‍ය සමබර පෞරුෂයකින් හෙබි දරු පරපුරක් බිහිකරලීම අපේක්ෂා කෙරේ.

ශිෂ්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාදාමය සාර්ථක කරගැනීමේ දී ගුරු කාර්ය භාරය, පහසුකම් සැලසීමේ හා උපකාරක සේවාවක් ලෙස ශිෂ්‍ය කේන්ද්‍රිය ව ක්‍රියාත්මක වන අතර පුද්ගල අනන්‍යතාවකින් යුත් ශිෂ්‍ය චර්යාමය නිපුණතා අදාළ නිර්ණායක ඔස්සේ නිරතුරු අධීක්ෂණයට ලක් කිරීම, ගුරුවරයාගේ විධිමත් තක්සේරු හා ඇගයීම් ක්‍රියාදාමය වඩාත් පහසු කරවීම පිණිස පාදක වනු ඇත.

7 වන ශ්‍රේණිය චිත්‍ර කලා විෂය ධාරාව උගන්නා සිසුන්ගේ උසස් ඉගෙනුම් අවස්ථා සඳහා ප්‍රගුණ කළ යුතු නිපුණතා මට්ටම්, නියමිත විෂය පරාසයට අනුකූල ව මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළ අන්තර්ගත කොට ඇත. අදාළ විෂය කොටස් සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට චිත්‍ර කලා ගුරුවරයාට ස්වාධීන අවකාශයක් ලබා දේ.

ගවේෂණ ශක්‍යතා තුළින් පෝෂණය වන විෂයානුබද්ධ ප්‍රායෝගික කුසලතා, සිසුන් සමාජගතවීමේ දී ඵලදායීවන අයුරින් ව්‍යවහාරික ජීවිතය හා බැඳි නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා යොමු කරවීමේ හා අන්තර් ජාතික දෘශ්‍ය නිර්මාණ දායකත්වය සඳහා සංවර්ධනය කරවීමේ ක්‍රමවේදයන්ට අයත් පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් මාලාවක් හඳුන්වා දී ඇත.

යහපත් චර්යාවන්ගෙන් හෙබි පූර්ණ සමාජානුයෝගයක් ලැබූ අනාගත ලෝකයට ඵලදායී හා නිර්මාණශීලී පුරවැසියකු බිහිකරලීමේ අපේක්ෂණයෙන් යුතු ව අදාළ ශිෂ්‍ය නිපුණතා සාක්ෂාත් කරගැනීම සඳහා මෙම චිත්‍ර කලා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිහරණය කිරීම ගුරුවරයාට මහත් පිටිවහලක් වනු ඇත.